වැලිකන්ද ප්‍රාදේශීය සභාව
පොළොන්නරුව දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව සහ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 30 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට වැලිකන්ද ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### (අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | උසාවි දඩ හා මුද්දර ගාස්තු ආදායම් උපචිත පදනම මත ගිණුම් තබා නොතිබුණි. | උපචිත පදනම අනුව ගිණුම් තැබිය යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

### (ආ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට නොවැම්බර් මාසය දක්වා උසාවි දඩ ආදායම රු.1,333,667 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබූ අතර දෙසැම්බර් මාසයට අදාල උසාවිදඩ මුදල් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරන දිනය වන විට තොරතුරු ලැබී තිබුණේ ජූලි මාසය වන තෙක් පමණි. |
| (ii) | සභාව සතු ජේසීබී යන්ත්‍රය හා ටිපර් රථය කුලියටදීම මඟින් සමාලෝචිත වර්ෂය තුල රු.142,375 ක් උපයා ඇති නමුත් මූල්‍ය | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | කුලී ආදායම් අය කිරීමේදී ආදායම් ශීර්ෂ වෙනස්වීමක් හේතුවෙන් |

| | | | |
|---|---|---|---|
| | ප්‍රකාශනවල එම ආදායම රු.112,375 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | | කුලී ආදායම් අඩුවෙන් සටහන් වී ඇත. |

**(ඇ) නොසැසඳුණු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2019 දෙසැම්බර් 31 දිනට හිඟ ජල ගාස්තු වාර්තාව අනුව වර්ෂයේ බිල්කල ජල ගාස්තු ආදායම රු.18,865,535 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල එම අගය රු.19,029,925 ක් ලෙස දැක්වීම හේතුවෙන් එම ආදායමෙහි රු.164,390 ක නොසැසඳීමක් පැවතුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. | වර්ෂයේ බිල්කල ජල ආදායම තුල LG ගොවිපලට සපයන ලද ජලය සඳහා අය කරන ලද ජල ගාස්තු ඇතුළත්ව නැත. |
| (ii) | කර්මාන්ත බදු, ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර තොරතුරු වාර්තාව අනුව එම ආදායම්වල වර්ෂයේ බිල්කල වටිනාකම රු.813,540 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන අනුව ඉහත ආදායම් ශීර්ෂයන්හි ආදායම රු.631,350 ක් වූයෙන් රු.182,190 ක නොසැසඳීමක් පැවතුණි. | නිවැරදි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | කර්මාන්ත බදු, ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර තොරතුරු වාර්තාවල ප්‍රචාරක හා දැන්වීම් පුවරු ආදායම් ද ඇතුළත්ව ඇත. |

**(ඈ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.355,324,466 ක් වූ ගිණුම් විෂයන් 09 ක් විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉඩම් හා ගොඩනැගිලි ලැබුණු ආකාරය සහ අයිතිය තහවුරු කිරීම පිළිබඳ නිරවුල් තොරතුරු සභාව සතුව නොපවතින බව පිළිගන්නා අතර, වර්තමානයේ සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීම හා වත්කම් පවරා ගැනීමේදී වඩාත් විධිමත් ආකාරයට කටයුතු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමි. භාණ්ඩ සමීක්ෂණ කටයුතු මේ වන විට සිදුකර ඇති අතර |

එම සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු සිදුකරමි.

**1.4 අනුකූල නොවීම්**

------------------

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

---------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | | | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | | |
| (i) | 152 (I) වගන්තිය | 15,000 | සභා බල ප්‍රදේශයේ ස්ථාපිත කර තිබුණු දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 05 කට අදාලව වෙළඳ/ව්‍යාපාර බදු අයකරගෙන නොතිබුණි. | දුරකථන කුළුණු ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ මුදල් අයකර ගැනීමට අදාල ආයතන වෙත ලිපි මඟින් දැනුම් දී ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය<br>---------- | | | | |
| (i) | රීති 59 | | සභා බල ප්‍රදේශයේ කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාර පිළිබඳ ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. | කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාර පිළිබඳ ලැයිස්තු පිළියෙල කර නියමිත දිනට පෙර ඉදිරිපත් කළ යුතුවේ. | ස්ථිර ආදායම් පරීක්ෂකවරයෙක් නොසිටීම නිසා අදාල සමීක්ෂණය නියමිත කාලය වන විට සිදුකර ගැනීමට නොහැකි විය. |
| (ii) | රීති 185 | 24,298,929 | ජංගම ගිණුමේ වර්ෂය මුළුල්ලේ රු.මි.13 සිට 24 දක්වා මුදලක් පැවති නමුත් අතිරික්ත මුදල් අයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. | අතිරික්ත මුදල් ආයෝජනය කර ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. ඉදිරියේදී කටයුතු කිරීමට සටහන් කරගනිමි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>------------ | | | | |
| | අංක 3/2015 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මු.රෙ.371 (5) | 88,500 | සමාලෝචිත වර්ෂයේ අවස්ථා 4 කදී ලබාදී තිබුණු අත්තිකාරම් මුදල් දින 92 සිට දින 152 දක්වා කාලයක් | අත්තිකාරම් කාල ප්‍රමාදයකින් තොරව පියවිය යුතුවේ. | අත්තිකාරම් පියවීම ප්‍රමාද වූ බව පිළිගනිමි. ඉදිරියේදී මෙම කටයුතු පිළිබඳව වඩාත් සැලකිලිමත්ව කටයුතු කිරීමට පියවර ගනිමි. |

| | | |
|---|---|---|
| ප්‍රමාද කර පියවා තිබුණි. | | |

**1.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**(අ) ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසානයට වසර 01 සිට 14 කට අධික කාලයක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ලැබිය යුතු ගිණුම් ශේෂ 09 ක එකතුව රු.35,279,567 ක් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ඉදිරියේ ලැබිය යුතු ගිණුම් ශේෂ අයකර ගැනීමට කටයුතු කරමි. |

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසානයට වසර 01 සිට 14 කට අධික කාලයක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.13,986,835 ක් වූ වියදම් ණයහිමි ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ණයහිමි ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | රු.468,474 ක මුදල් ඉදිරියේදී රාජ්‍ය ආදායමට ගැනීමටත්, රු.2,359,561 ක මුදලක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් හා රු.7,644,221 ක මුදලක් පලාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය වීමෙන් පසු ගෙවීම් සිදුකිරීමටත්, රු.3,514,579 ක මුදල ඉදිරියේදී ගෙවීමටත් කටයුතු කරමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,123,800 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,346,930ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන් තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | සමුච්චිත හිඟය | ඇස්තමේන්තු-ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | සමුච්චිත හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 359,000 | 574,500 | 574,500 | (215,500) | 493,600 | 392,600 | 392,600 | 101,000 |
| කුලී | 4,934,740 | 4,690,144 | 4,713,627 | 221,112 | 4,922,946 | 1,667,450 | 1,946,644 | 2,976,297 |
| බලපත්‍ර ගාස්තු | 1,342,500 | 700,530 | 700,530 | 641,970 | 1,050,000 | 2,843,262 | 2,843,262 | (1,793,262) |
| වෙනත් ආදායම් | 20,384,800 | 9,177,139 | 22,384,046 | (1,999,246) | 16,005,413 | 9,555,744 | 22,547,570 | (6,242,157) |
| එකතුව | 27,021,040 | 15,142,313 | 28,372,703 | (1,351,664) | 22,471,959 | 14,459,056 | 27,730,076 | (4,958,122) |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වාර්ෂිකව බදු දෙනු ලබන වෙළඳ ස්ථාන වලින් අවස්ථා 12 කදී හිඟ හිටි බදු කුලී රු.554,918 ක් වර්ෂ 02 ත් 18 ත් අතර කාලයක් තිස්සේ අයනොවී පවතින අතර එම මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී හිඟ ආදායම් අයකර ගැනීමට නීතිමය කටයුතු සිදුකරන බව දන්වමි. |
| (ආ) කුලී | | |
| (i) සමාලෝචිත වර්ෂය අවසන්වන විට කඩ කාමර 35 කින් හා මාළු කඩ 7 කින් හිඟ හිටි කුලී මුදල රු.1,999,178 ක් වූ අතර ඉන් වර්ෂ 2 ත් 4 ත් කාලයක සිට හිඟව පවතින මුදල රු.1,354,562 ක් විය. එම හිග මුදල් අයකර ගැනීම සඳහා සභාව විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී හිඟ ආදායම් අයකර ගැනීමට පියවර ගන්නා බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | සෙවනපිටිය පළමු අදියරේ කඩ කාමර 13 ක කුලී ආදායම් තක්සේරු කිරීමකින් තොරව මසකට රු.2,500 බැගින් අයකර තිබුණි. | තක්සේරු කර ඒ අනුව කුලී මුදල් අයකිරීමට කටයුතු කළ යුතුවේ. | තක්සේරු කර ඇතත් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් මෙතෙක් එම තක්සේරු වාර්තාව ලැබී නැත. |
| (iii) | සෙවනපිටිය දෙවන අදියරේ කඩකාමර 10 ක් සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවේ මාසික කුලී තක්සේරුව අනුව 2018 මැයි 01 දින සිට මසකට රු.6,000 බැගින් අයකල යුතු වුවත්, එම කඩ කාමරවලින් මසකට රු.2,500 බැගින් අයකිරීම හේතුවෙන් 2018 මැයි 01 සිට 2019 දෙසැම්බර් 31 දින වන විට රු.700,000 ක පාඩුවක් සිදුවී තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුවට අනුව කුලී අය කිරීමට කටයුතු කළ යුතුවේ. | 2019.01.16 වන දින පැවති මහ සභාව විසින් මේ සම්බන්ධව නීති උපදෙස් සඳහා කමිටුවක් පත්කර අදාල කරුණු සාකච්ඡා කර ඉදිරි කටයුතු සිදුකිරීම සුදුසු බව මහ සභාවේ සම්මත විය. |
| (iv) | සෙවනපිටිය තෙවන අදියරේ කඩ කාමර 13 න් කඩ කාමර 07 ක මාසික කුලිය තක්සේරු කිරීමකින් තොරව මසකට රු.1,500 බැගින් අයකර තිබුණි. | තක්සේරු කර ඒ අනුව කුලී මුදල් අයකිරීමට කටයුතු කළ යුතුවේ. | තක්සේරු කර ඇතත් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් මෙතෙක් එම වාර්තාව ලැබී නැත. |
| (v) | සෙවනපිටිය තෙවන අදියරේ කඩකාමර 05 ක් සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවේ මාසික කුලී තක්සේරුව අනුව මසකට රු.3,300 බැගින් සහ කඩකාමර අංක 07 සඳහා මසකට රු.3,000 බැගින් අයකල යුතු වුවත් ප්‍රාදේශීය සභාව විසින් මසකට රු.1,500 බැගින් අයකිරීම හේතුවෙන් 2018 මැයි 01 සිට 2019 දෙසැම්බර් 31 දින වන විට රු.210,000 ක පාඩුවක් සිදුවී තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුවට අනුව කුලී අය කිරීමට කටයුතු කළ යුතුවේ. | 2019.01.16 වන දින පැවති මහ සභාව විසින් මේ සම්බන්ධව නීති උපදෙස් සඳහා කමිටුවක් පත්කර අදාල කරුණු සාකච්ඡා කර ඉදිරි කටයුතු සිදුකිරීම සුදුසු බව මහ සභාවේ සම්මත විය. |
| (vi) | 2019 දෙසැම්බර් 31 දිනට මුළු කඩකාමර කුලී හිඟ මුදල රු.1,999,178 ක් වූ අතර, ඉන් රු.1,335,463 ක් එනම්, සියයට 88 ක් සෙවනපිටිය වෙළඳ සංකීර්ණයේ කඩකාමර 36 කට අදාල හිඟ විය. | හිඟ මුදල් කඩිනමින් අය කරගැනීමට හෝ නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුවේ. | කඩ කාමර කිහිපයක හිඟ මුදල් අයකරගෙන ඇති අතර අනෙකුත් හිඟ මුදල් වාරික වශයෙන් අයකර ගනිමින් පවතී. හිඟ මුදල් නොගෙවන කඩහිමියන් හට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| (vii) | සෙවනපිටිය කඩකාමර ගිවිසුම්වල කොන්දේසි අංක 01.11 අනුව නියමිත දිනට බදුකුලී ගෙවීම අඛණ්ඩව මාස 03 ක් පැහැර හරින විට හිඟ කුලී අයකරගෙන කඩකාමරය නැවත ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීමේ බලය තිබුණද, මාස 09 සිට අවුරුදු 04 දක්වා මාසික කුලී පැහැර හැර ඇති කඩකාමර හිමියන් 23 ක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. | ගිවිසුම් ප්‍රාකරව කටයුතු කර හිඟ මුදල් අයකරගත යුතුවේ. | ඉදිරියේදී හිඟ ආදායම් අයකර ගැනීමට ගිවිසුමෙහි කොන්දේසි අනුව පියවර ගනු ලබන බව දන්වා සිටිමි. |

### 2.2.3 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට සභා බල ප්‍රදේශයේ වෙළඳ ස්ථාන වලින් අයවිය යුතු වෙළඳ බලපත්‍ර ගාස්තු රු.412,615 ක් හිඟව පැවතුණි. | බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ ආදායම් සමීක්ෂණය මඟින් බල ප්‍රදේශයේ අදාල වෙළඳ ආයතන හඳුනාගෙන බලපත්‍රයට යටත් කොට බලපත්‍ර ගාස්තු අයකිරීමට කටයුතු කරන බව දන්වමි. |

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ලෙස හඳුනාගෙන තිබුණු උසාවි දඩ මුදල රු.9,071,135 ක් වූ අතර, 2018 ජූලි මස සිට අයවිය යුතු මුද්දර ගාස්තු ආදායම් හඳුනාගෙන නොතිබුණි. | හිඟ මුදල් ලබා ගැනීමට හා හඳුනා නොගත් ආදායම් හඳුනාගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී සියළු උසාවි දඩ හා මුද්දර ගාස්තු හඳුනාගෙන සභාව වෙත ලබාගැනීමට පියවර ගන්නා බව දන්වා සිටිමි. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කාර්යසාධනය

---------------

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳව කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබවිහරණය,පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරී සැලැස්ම

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පනවා කාර්යයන් ඉටුකරවා ගැනීම සඳහා රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 1/2014 අනුව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණද, එහි ඇතුලත් කාර්යයන් ක්‍රියාත්මක කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. 2020 වර්ෂයට අදාලව සකස් කල ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කරුණු ක්‍රියාත්මක කරමින් පවතී. |

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

| | | |
| --- | --- | --- |
| සභා බල ප්‍රදේශයේ දෛනිකව ජනනය වන ටොන් 02 ක පමණ වූ කසල ප්‍රමාණයක් සභාව සතු ඇතුගල පිහිටි අපහරණ භූමිය වෙත බැහැර කරනු ලබන අතර විධිමත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩපිළිවෙලක් සකස් කර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | කසල ප්‍රතිචක්‍රීකරණය කිරීම හා විධිමත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙලක් සකස් කරගත යුතුවේ. | පිළිගනිමි. කසල ප්‍රවාහනය සඳහා අවශ්‍ය කරනු ලබන කම්පැක්ටර් රථයක් අප සතුව නොමැත. ඒ සඳහා ලිඛිතව හා වාචිකව ඉල්ලීම් කර ඇත. 2020 සංවර්ධන සැලැස්ම යටතේ නොදිරන කසල අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා යෝජනා ඉදිරිපත් කර ඇත. |

(ඇ) තිරසර සංවර්ධන අරමුණු

----------------------------

| | | | |
|---|---|---|---|
| (i) | එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් හඳුන්වා දී තිබුණු තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව සභාව දැනුවත් වී තිබුණද, එම අරමුණු අතරින් සභාවට අදාල අරමුණු නිවැරදිව හඳුනාගෙන නොතිබුණු අතර, අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක සඳහා දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයක් නොතිබුණි. 2017, 2018 හා 2019 වර්ෂවල තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සභාව විසින් හඳුනාගෙන නොතිබුණි. ඉලක්ක කරා ළඟාවීම සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ ක්‍රමවේදයක් හා අරමුණු ඉටුකර ගැනීම සඳහා සම්බන්ධ කරගත යුතු අනෙකුත් රාජ්‍ය ආයතන හඳුනාගෙන නොතිබුණි. | සභාවට අදාලව අරමුණු හඳුනා ගැනීම, දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයන් සැකසීම, මූල්‍ය ප්‍රතිපාදන කිරීම සම්බන්ධිත ආයතන හඳුනාගැනීම කළ යුතුවේ. | පිළිගනිමි. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

--------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ----------- | ------------- |
| (අ) | ලේකම් තනතුර, සංවර්ධන නිලධාරී තනතුරු 06 ක් සහ තාක්ෂණික නිලධාරී තනතුර වසර ගණනාවක සිට පුරප්පාඩුව පැවතුණි. | අත්‍යවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලිඛිතව හා වාචිකව ඉල්ලීම් කර ඇතත් එම පුරප්පාඩු සම්පූර්ණ කර නොමැත. |
| (ආ) | අනියම් පදනම මත රියදුරු තනතුරක්, මුරකරු තනතුරු 03 ක්, සෞඛ්‍ය කම්කරු තනතුරු 02 ක් සහ මනු කියවීමේ තනතුරු 02 ක් වශයෙන් නිලධාරීන් 08 ක් බඳවාගෙන තිබුණි. | අවශ්‍යතාවය අනුව කාර්යය මණ්ඩලය සංශෝධනය කරවාගත යුතුවේ. | ආයතනය මේ වන විට පවතින්නේ අවුරුදු 14 කට පෙර සභාව ආරම්භයේදී පැවති අනුමත කාර්යය මණ්ඩලය මත බැවින් කාර්යය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම නිසා අනියම් පදනම මත බඳවාගැනීම් සිදුකර ඇත. |

**3.3 වත්කම් කළමනාකරණය**

**3.3.1 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු එකතු වටිනාකම රු.2,541,776 ක් වූ වත්කම් ඒකක 11 ක් දීර්ඝ කාලයක සිට නිෂ්කාර්යව පවතින අතර නිෂ්කාර්යව පැවති කාලය පිළිබඳව තහවුරුවක් ලබා ගැනීමට නොහැකි විය. | ඵලදායි ලෙස උපයෝජනය කිරීමට හැකිවන ලෙස කටයුතු කළ යුතුවේ. | අලුත්වැඩියා කර භාවිතයට ගතහැකි වත්කම් භාවිතයට ගැනීමටත්, අලුත්වැඩියා කිරීමට නොහැකි වත්කම් 2019 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මඟින් ලබාදී ඇති නිර්දේශ අනුව අපහරණය කිරීමටත් කටයුතු කරන බව දන්වා සිටිමි. |

**3.3.2 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුවේ. | සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ කටයුතු මේ වන විට සිදුකර ඇත. |

**4 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ ගනුදෙනු සම්බන්ධයෙන් වූ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණන පරික්ෂාවක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනය නිසි පරිදි සිදුකළ යුතුවේ. | 2020 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමි. |

**4.2 විගණන හා කළමණාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු 01 ක් පමණක් පවත්වා තිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු නිසි පරිදි පැවැත්විය යුතුවේ. | පිළිගනිමි. ඉදිරියේදී විගණන කමිටු නිසි පරිදි පැවැත්වීමට කටයුතු කරමි. |